තුම්පත් රටා - 2

# සිංහල බුදු සමය

(c) Sumitha Publishers

ජේ. බී. දිසානායක
කොළඹ විශ්ව විද්‍යාලයේ සිංහල අංශයේ සම්මානිත මහාචාර්ය

# පටුන


පෙර වදන

| | | |
|---|---|---|
| 1. | අපේ බුදුන් අපි වඳින්ට | 1 |
| 2. | සාදු සාදු සිරි පාදෙ වඳිනවා | 13 |
| 3. | වරම් ගනිමි දළදා හිමි රුවන් වැඳ | 23 |
| 4. | උඩමළුවේ බෝදිසාමි පිරිමි පුතෙක් දෙන්ටයි | 39 |
| 5. | තෙපි බෝධීන් වහන්සේට පෙරහර කරව | 49 |
| 6. | සිවුවරම් දෙවිඳු පිදුවා පාත්තරෙ | 59 |
| 7. | එමැද වැඩ උන් බණ අසුන් පිට<br>යතිඳු පා වැඳලා කියමි | 71 |
| 8. | සංඝං සරණේ සිවුරු දරා ගෙන | 81 |
| 9. | මේ වස්සාන කාලයයි | 95 |
| 10. | කියනෙමි වට වන්දනා එමාලේ | 107 |


(c) Sumitha Publishers

# පෙර වදන

සිංහල ජන සංස්කෘතිය පොදු රසිකයාට හඳුන්වා දෙනු පිණිස පැවැත්වුණු ‘තුම්පත් රටා’ නම් ගුවන් විදුලි වැඩ සටහන පදනම් කොට ගෙන පළ කරනු ලබන පොත් පෙළෙහි දෙවැන්න ‘සිංහල බුදු සමය’ යන නමින් මෙසේ කල එළි බසී. බුදු දහම එක් රටකට හෝ එක් ජාතියකට හෝ එක් සංස්කෘතියකට හෝ සීමා වන දර්ශනයක් නොවේ. එසේ නම් එය ‘සිංහල බුදු සමය’ යනුවෙන් වෙසෙසා දැක්වීමෙහි අර්ථය කුමක් ද?

ක්‍රිස්තු පූර්ව හවැනි සියවසෙහි භාරතය විවිධ දාර්ශනිකයන්ට තෝතැන්නක් මෙන් විය. මේ අවධියෙහි පහළ වූ එක් දාර්ශනිකයෙක් බුදුන් වහන්සේ ය. හිමාලය අඩවියෙහි පිහිටි ප්‍රාන්ත රාජ්‍යයක රජ මැඳුරක යස ඉසුරු මැද ‘සිද්ධාර්ථ ගෞතම’ යන නමින් උපන් උන් වහන්සේ යෞවුන් වියෙහි සිට ම දාර්ශනික ප්‍රශ්න කෙරෙහි නැඹුරු වූ සිත් ඇත්තෙක් වූහ. එවක වූ විවිධ ශාස්තෘවරුන් ඇසුරෙහි හැදී වැඩුණු උන් වහන්සේ ඒ එක් දර්ශනයකින් වත් ස්වකීය ඥාන පිපාසය සන්සිඳවා ගැනීමට හෝ ප්‍රඥා ප්‍රදීපය දල්වා ගැනීමට හෝ සමර්ථ වූයේ නැත. අවසානයෙහි දී තමාගේ ම නැණ නුවණ මෙහෙයවා ප්‍රඥාව වඩා ජීවිතය හා ලෝකය පිළිබඳ සත්‍යය අවබෝධ කොට ගත් උන් වහන්සේ ‘බුද්ධ’ යන නමින් හඳුන්වනු ලැබූහ. සත්‍යය අවබෝධ කොට ගත් තැනැත්තා යන අර්ථය ‘බුද්ධ’ යන පදයෙහි ගැබ් වී ඇත.

බුදුන් වහන්සේ අවබෝධ කොට ගත් සත්‍යය කුමක් ද? ලෝකය දුකින් පිරී පවත්නා බව ද, එසේ වීමට හේතුව මිනිසා තුළ පවත්නා තෘෂ්ණාව බව ද, තෘෂ්ණාව ඉවත් කොට ගැනීමෙන් දුක නැති කොට සිත නිවා ගත හැකි බව ද, එසේ දුක් නිවා ගැනීමට මාර්ගයක් ඇති බව ද යන සිව් වැදෑරුම් කරුණු උන් වහන්සේ අවබෝධ කොට ගත්හ. මේ අතුරින් පළමුවන කරුණු තුනින් උන් වහන්සේගේ දර්ශනයත්, සිව්වැන්නෙන් උන් වහන්සේගේ

(c) Sumitha Publishers

සදාචාර මාර්ගයත් හෙළි වේ. දුක් නැති කොට නිවන් සුව සලසා ගැනීම පිණිස දෙවියෙකුගේ හෝ බ්‍රහ්මයෙකුගේ හෝ පිළිසරණ අවශ්‍ය නොවන බවත් එය තමාගේ වෑයමින් ම සාක්ෂාත් කොට ගත යුතු බවත් උන් වහන්සේ අවධාරණයෙන් පෙන්වා දුන්හ. මේ දර්ශනයත් ධර්ම මාර්ගයත් තත්කාලීන භාරතීය සමාජය තුළ මහත් විප්ලවයක් ඇති කිරීමට සමත් විය.

ඕනෑ ම දර්ශනයක් හුදෙක් දාර්ශනිකයන්ට පමණක් සීමා වී පවත්නා තාක් කල් හුදු දර්ශනයක් ව පවතී. එහෙත් එය පොදු ජනයා අතරට පත් වත් ම ඒ වටා සංස්කෘතියක් ද ගොඩ නැඟෙන්නට වෙයි. මේ අනුව, බුදු දහම වටාත් 'බෞද්ධ' යැයි වෙසෙසා දැක්විය හැකි සංස්කෘතියක් ගොඩ නැඟෙන්නට විණ. 'බෞද්ධ' යැයි කිව හැකි වෙහෙර විහාර, පුද පූජා, වත් පිළිවෙත්, සිරිත් විරිත්, කලා නිර්මාණ ආදිය මේ සංස්කෘතියෙහි අනිවාර්ය අංග වේ. මේ සංස්කෘතිය මුලින් ම පහළ වූයේ භාරතයෙහි බැවින් එවක භාරතයෙහි මුල් බැස තිබූ යම් යම් සංස්කෘතික අංගෝපාංග ද මීට එක් විණ.

(c) Sumitha Publishers

මුල දී භාරතයට පමණක් සීමා වුණු බුදු සමය ධර්මාශෝක වැනි රජවරුන්ගේ අනුග්‍රහය යටතේ භාරතය අවට ආසියාතික රටවල ද පැතිර ගියේ ය. බුදු සමය ඒ ඒ රටවල මුල් බැස ගත්තේ ඒ ඒ රටවල එතෙක් පැවති සංස්කෘතියෙහි ඇතැම් ලක්ෂණ ද ඊට උකහා ගැනීමෙනි. ඒ අනුව, චීනයෙහි පැතිර ගිය බුදු සමය 'චීන බුදු සමය' යනුවෙන් ද, බුරුමයෙහි පැතිර ගිය බුදු සමය 'බුරුම බුදු සමය' යනුවෙන් ද ජපානයෙහි පැතිර ගිය බුදු සමය 'ජපන් බුදු සමය' යනුවෙන් ද, හැඳින්වීම යුක්තියුක්ත වේ. අශෝක අධිරාජයාණන්ගේ පුත් මිහිඳු මා හිමියන් විසින් ක්‍රිස්තු පූර්ව තුන් වන සියවසෙහි දී ලක්දිවට හඳුන්වා දෙන ලද බුදු සමය මෙරට මුල් බැස ගත්තේ සිංහල සංස්කෘතියට ආවේණික වූ නොයෙක් ලක්ෂණ ද උකහා ගනිමිනි. සිංහලයන් අතර අද දක්වා ම පවතින මේ බෞද්ධ සංස්කෘතිය 'සිංහල බෞද්ධ සංස්කෘතිය' යනුවෙන් හැඳින්විය හැකි ය. එය 'චීන බුදු සමයට' ද 'බුරුම බුදු සමයට' ද 'ජපන් බුදු සමයට' ද වඩා වෙනස් වූවකි.

'සිංහල බුදු සමය' වැනි පද මුලින් ම වහරට ගන්නා ලද්දේ බෞද්ධයන් විසින් නොව ආගමික වත් පිළිවෙත් විද්‍යාත්මක ව හදාරන මානව විද්‍යාඥයන් හා සමාජ විද්‍යාඥයන් විසිනි. කිසි ම ආගමික දර්ශනයක් එය හෙළි කළ ශාස්තෘන් වහන්සේ දැක්වූ පරිද්දෙන් ම අද නොපවත්නා බව වටහා ගත් මානව විද්‍යාඥයෝත් සමාජ විද්‍යාඥයෝත් ඒ ඒ දර්ශන ඒ ඒ සමාජවල ඇත්ත වශයෙන් ම භාවිත වන ආකාරය හැඳින්වීම පිණිස 'ඉන්දියානු බුදු සමය', 'චීන බුදු සමය', 'ජපන් බුදු සමය' වැනි පද වහල් කොට ගනිති. එබැවින් මෙහි ලා බුදු සමය වෙසෙසා දැක්වීමට 'සිංහල' යන පදය යොදන්නේ එය වෙනත් රටවල පවත්නා බුදු සමයට වඩා වෙනස් බව කියා පෑමේ අරමුණෙනි. ඒ මිස, සිංහල බුදු සමය වෙනත් සංස්කෘතිවල පවත්නා බුදු සමයට වඩා විශිෂ්ට බවක් මෙහි ලා කිසිසේත් අදහස් නොකෙරේ.

බුදු සමය 'සිංහල' යන පදයෙන් වෙසෙසා දැක්වීම මානව විද්‍යාඥයන් හා සමාජ විද්‍යාඥයන් මෙතෙක් අනුගමනය කළ මාර්ගයට අනුකූල වේ. එබැවින් 'සිංහල බෞද්ධ' යන දෙ පදය දුටු එමඟින් ජාත්‍යන්තරවාදී ලාංකික උගතුන් කලබල නොවෙත්වා! 'සිංහල ජාතිවාදියෙකු' වශයෙන් ම නොගරහත්වා! ජාතීන් අතර සැබෑ සුහදතාව ගොඩ නැගිය හැක්කේ ඔවුනොවුන්ට ආවේණික සංස්කෘතිවල යථා ස්වරූපය සාවධාන ව අවබෝධ කොට ගැනීමෙන් විනා ඒ ඒ ආගම්වල ද සංස්කෘතිවල ද මතු පිටින් පෙනෙන සමානකමක් දෙකක් සලකා, සියලු ආගම් දහම් හා සංස්කෘතීහු එක සමාන වෙතියි මුසා බස් දෙඩීමෙන් නොවන බව මම තරයේ විශ්වාස කරමි. ඒ ඒ ආගම් දහම්වල හා සංස්කෘතිවල වෙනස්කම් හඳුනා ගෙන, ඒ වෙනස්කම් අගතියෙන් තොර ව අගය කරන්නෝ පමණක්, මානව වර්ගයා අතර අන්‍යෝන්‍ය අවබෝධය වැඩි දියුණු කිරීමට සමර්ථ වන්නාහු ය.

සිංහල බුදු සමයෙහි හැම මුහුණුවරක් ම මෙහි ලා විමසිල්ලට හසු නොවේ. මෙහි ලා පාඨක අවධානය යොමු වන්නේ සිංහල බුදු සමයට අදාළ කරුණු දහයක් කෙරේ පමණකි. මෙහි මුල් ම පරිච්ඡේද දෙක බුදුන් වහන්සේ පිළිබඳව ය. 'අපේ බුදුන් අපි වඳින්ට' යන පරිච්ඡේදයෙන් උන් වහන්සේගේ රූපකාය පිළිබඳ

(c) Sumitha Publishers

ඇදහිලි විශ්වාස සමහරක් විස්තර කෙරේ. උන් වහන්සේ කෙරේ පිහිටි දෙතිස් මහා පුරුෂ ලක්ෂණත්, බුදු පිළිමයක් නෙළීමෙහි දී සිංහල කලාකරුවා අනුගමනය කරන සම්ප්‍රදායත් එහි දැක්වේ. ‘සාදු සාදු සිරි පාදෙ වඳිනවා’ යන පරිච්ඡේදයෙන් හෙළි වන්නේ උන් වහන්සේගේ ‘සිරි පතුල’ වටා ගෙතුණු ඇදහිලි හා විශ්වාස ආදිය යි.

බුදුන් වහන්සේ නියෝජනය කරනු පිණිස පවත්නා ‘ධාතූන් වහන්සේලා’ සමහරක් අරබයා සිංහල සමාජයෙහි දක්නට ලැබෙන සිරිත් විරිත් ආදිය ඊළඟ පරිච්ඡේද හතරින් විවරණය කෙරේ. උන් වහන්සේගේ ‘ශාරීරික ධාතූන් වහන්සේලා’ අතුරෙහි මුල් තැනක් ගන්නේ ‘දළදා වහන්සේ’ය. සිංහලයා දළදා වහන්සේ රැක බලා ගන්නා ආකාරය ‘වරම් ගනිම් දළදා හිමි රුවන් වැඳ’ නම් වූ පරිච්ඡේදයෙන් විස්තර කෙරේ. උන් වහන්සේගේ ‘පාරිභෝගික චෛත්‍යයන්’ අතුරින් දෙ නමක් ගැන තොරතුරු මෙහි ඇතුළත් වේ. ඉන් ‘බෝධීන් වහන්සේ’ පිළිබඳව පරිච්ඡේද දෙකකි: ‘උඩමළුවේ බෝදි සාමි පිරිමි පුතෙක් දෙන්ටයි’ යන පරිච්ඡේදයෙන්, අනුරාධපුයේ පිහිටි ජය සිරිමා බෝධීන් වහන්සේ පිළිබඳව ද ‘තෙපි මහා බෝධීන් වහන්සේට ගෞරව කරව්’ යන පරිච්ඡේදයෙන් බෝධීන් වහන්සේ රැක බලා ගැනීමට ලක්දිවට එවන ලද පිරිස් පිළිබඳව ද කරුණු දැක්වේ. උන් වහන්සේගේ පාත්‍ර ධාතූන් වහන්සේ පිළිබඳ තොරතුරු ‘සිව් වරම් දෙවිඳු පිදුවා පාත්තරේ’ යන පරිච්ඡේදයෙහි විමසිල්ලට හසු කෙරේ.

බුදුන් වහන්සේගේ ධර්මය දේශනා කරන ක්‍රම ද සංස්කෘතියෙන් සංස්කෘතියට වෙනස් වේ. සිංහල සමාජයෙහි පවත්නා එබඳු එක් අවස්ථාවක් ‘ආසන දෙකේ බණ’ කීමෙහි දී දක්නට ලැබේ. ‘එමැද වැඩ උන් බණ අසුන් පිට - යතිඳු පා වැඳලා කියම්’ යන පරිච්ඡේදයෙන් විස්තර වන්නේ යුගාසන ධර්ම දේශනාවක් පිළිබඳ තොරතුරු යි.

සිංහල සංඝ සමාජය ද වෙනත් රටවල සංඝ සමාජවලට වඩා වෙනස් වන්නකි. සිංහල කුල දරුවෙකු මහණ බිමට ඇතුළු කිරීමෙහි දීත්, සාමණේර නමකට උපසම්පදාව දීමේදීත් අනුගමනය කරන සිරිත් විරිත් ‘සංසං සරණේ සිවුරු දරා ගෙන’ යන පරිච්ඡේදයට වස්තු විෂය වේ. වස්සාන කාලයට සිංහල

(c) Sumitha Publishers

භික්ෂූන් වහන්සේලා ද ගිහියන් ද අනුගමනය කරන වත් පිළිවෙත් පිළිබඳ තොරතුරු 'මේ වස්සාන කාලයයි' යන පරිච්ඡේදයෙන් විස්තර වේ.

මෙහි අවසාන පරිච්ඡේදය සිංහල ගිහි සමාජයෙහි පැතිකඩක් හෙළි කරනු පිණිස වෙන් වේ. එනම්, සිංහලයන් 'වට වන්දනාවේ' යන ආකාරය යි. 'කියනෙම් වට වන්දනා එමාලේ' නම් වූ මේ පරිච්ඡේදයෙන් විවරණය කෙරෙන්නේ සිංහලයාගේ වන්දනා ගමන් පිළිබඳ තොරතුරු යි.

මෙහි එන පරිච්ඡේද දහයට පාදක වූ වැඩසටහන් මුලින් ම ඉදිරිපත් කරන ලද්දේ ගුවන් විදුලියට යෝග්‍ය වූ ශ්‍රවණ මාධ්‍යයෙනි. ශ්‍රවණගෝචර වූ ඒ වැඩ සටහන්, මෙසේ දෘෂ්ටිගෝචර මාධ්‍යයකට හැරවීමෙහි දී වෙනස්කම් කිහිපයක් සිදු කිරීම අවශ්‍ය වේ. ඉන් එක් වෙනසක් නම් ගුවන් විදුලි වැඩ සටහනේ ආ කට වහර, ගත් වහරට සරිලන පරිදි වෙනස් කිරීම ය. කිසිවෙකුගේ භාෂණයක් උපුටා දක්වන අවස්ථාවල දී හැර සෙසු අවස්ථාවල යෙදුණු කට වහර, ගත් වහරට අනුරූප වන පරිදි වෙනස් කරන ලද්දේ, ලේඛන ව්‍යවහාරය සඳහා යෝග්‍යතම මාධ්‍යය ගත් වහර යැයි සිංහල වියතුන් [illegible] අදහන හෙයිනි.

මෙවන් පොතක් පළ කිරීමට හැකි වූයේ මෙවන් ගුවන් විදුලි වැඩ සටහන් මාලාවක් ගුවන් විදුලි සේවයෙන් විසුරුවා හැරීමට ඉඩ ප්‍රස්තාවක් ලැබුණු හෙයිනි. එබැවින් ගුවන් විදුලි වැඩ සටහන් සම්පාදනයට අවසර දුන්නා වූ ද, ඒවාට නන් අයුරින් සම්මාදන් වූ ද සියලු දෙනාට මගේ ස්තුතිය පිරිනැමේ. මෙහි ලා 'තුම්පත් රටා' වැඩ සටහනේ සම්පාදකවරයා වූ රාජා ධර්මපාල මහතා මගේ ගෞරවාදරයට වෙසෙසින් ම පාත්‍ර වන්නෙකි.

මේ වැඩ සටහන් පිළිවෙළින් කැසට් පටිවලට නගා ආරක්ෂා කොට දුන් සමිතජීව දිසානායක මහතා ද, ඒවා පිටපත් කිරීමේ වෙහෙසකර වූ කාර්යය කැමැත්තෙන් ම භාර ගත් ජී. ආර්. ඩී.බණ්ඩාර මහතා ද මගේ ගෞරවාදරයට පාත්‍ර වෙති.

**ජේ. බී. දිසානායක**

නුගේගොඩ, පීටර්ස් පෙදෙසේ
අංක 2 'ඒ' නිවසේ දී ය.

(c) Sumitha Publishers

# 1



# අපේ බුදුන් අපි වඳින්ට

දඹදිව හිමාලය අඩවියෙහි පිහිටි රාජධානියක බොහෝ ගුණවන්ත රජ්ජුරු කෙනෙක් රාජ්‍ය කළහ. ඒ රජ්ජුරුවන්ට එබඳු ම ගුණවන්ත දේවීන් වහන්සේ කෙනෙක් ද වූහ. එක් රාත්‍රියක ඕ තොමෝ අපූරු සිහිනයක් දුටුවාය. **'පූජාවලිය'** නම් වූ සිංහල ග්‍රන්ථය ලියූ හාමුදුරුවෝ ඒ සිහිනය මෙසේ විස්තර කරති:

"ඒ පර්වතයට නුදුරු තෙන ඝන රන්මය වූ දෙව්යයක් පමණ ගවු උස චිත්‍රකූට පර්වතය මුදුනෙහි සිට ඇළි ඇත් පැටවෙක් රිදී දමක් වන් සොඬින් සුදු පියුමක් ගෙන ඒ පර්වතයෙන් බැස බිසවුන් බල බලා ඔත් දී ම ඒ රිදී පර්වතයට නැඟී රන් පායට වැද බිසවුන් සැතපුණු දිව යහන වටා තුන් යළක් ඇවිද දක්ෂිණ භාගයෙන් බිසොවුන් කුසට වැද ගියේ නම."

- *(පූජාවලිය, ප්‍රතිසන්ධි පූජා කථා)*

මේ සිහිනය දුටු බිසොවුන් වහන්සේ **'මහාමායා'** නම් වූහ. ඕ තොමෝ ශාක්‍ය වංශිකයෙකු වූ සුද්ධෝදන රජ්ජුරුවන්ගේ අග බිසෝ තනතුර දැරූහ. සිංහල ජන කවියෙක් මේ සිහිනය මේ ආකාරයෙන් කවියට නඟයි:

දෙනෝ දහක් අඟනෝ මට මල් නෙළු වා
අනෝ තත්ත විල මැද යහනක හිඳු වා
කන්‍යා ලියෝ දෙ දෙනෙක් පැන් නැවෙව් වා
අනෝ තත්ත විල මම සිහිනෙන් දුටු වා

සුද්ධෝදන රජ්ජුරුවෝ වේදයෙහි නිපුණ බමුණන් සූ සැට දෙනෙකු කැඳවා බිසොවුන් වහන්සේ දුටු සිහිනය කුමක් දැයි විචාළහ. බමුණෝ සිහිනය මෙසේ තෝරා දෙති:

සුද්දෝදන නරනිඳුනේ අසනව ට
නපුරු සිහින නොපෙනේ පින් කළ අය ට
පෙනුණ සිහිනෙ දරු සීනේ මයි නුඹ ට
පින් ඇති බෝසතෙක් උපදියි තුන් ලොව ට

මේ ආකාරයෙන් උපන් කුමාරයාගේ **දේහ ලක්ෂණ** පරීක්ෂා කළ බමුණෝ ඒ කුමාරයා පිළිබඳව අනාවැකි පළ කළහ. පූජ්‍ය ගණේගම සරණංකර හාමුදුරුවෝ මේ සිද්ධිය මෙසේ පහදා දෙති:

"ඒ කාලෙ සිරිත ඔය රජ පවුල්වල කුමාරයෙක් බිහි වුණාම බමුණන් ගෙන්නලා කුමාරයාගෙ දේහ ලක්ෂණ පරීක්ෂා කරවනවා. ඒ අනුව අනාගතය ගැන කියවන සිරිතක් තිබිලා තියෙනවා. එදා ආපු බ්‍රාහ්මණයෝ අට දෙනාගෙන් එක් කෙනෙක් ඇර අනික් අය ඔක්කොම කීවෙ 'මේ පින්වන්ත කුමාරයා එක්කො බුදු වෙනවා නැත්නම් චක්‍රවර්ති රජ වෙනවා' කියලා. එක් කෙනෙක් පමණක් කිව්වා 'නිසැක වශයෙන් ම බුදු වෙනවා' කියලා. එයා කිව්වෙ සිද්ධාර්ථ කුමාරයාගෙ නළලෙ තිබුණ **ඌර්ණ රෝම ධාතුව** දැකලා."

පිය මහ රජාණන් සිය පුතණුවන්ට නම් තැබුවේ '**සිද්ධාර්ථ**' යනුවෙනි. මේ කුමාරයා විවාහ වූයේ **යසෝධරා** නම් වූ ඉතා ම රූප සම්පන්න කුමාරිකාවක සමඟ ය. විවාහ වී අවුරුදු කිහිපයකට පසු ව ගිහි ජීවිතය කෙරෙහි කලකිරුණු මේ කුමාරයා සත්‍යය සොයා වනගත වූයේය. මේ වෙන් වීම නිසා බලවත් ශෝකයක් යසෝධරා දේවීන්ගේ සිතෙහි උපන. එහෙත් සැමියාගේ ගමනට ඕ තොමෝ බාධා නොකළාය. ඇය සිතින් මෙසේ ප්‍රාර්ථනා කළාය:

හිමයේ ගොසින් මල් යහනක නිඳනව ද?
කෝමල අනගි සිරිපා දෙක රිදෙනව ද?
හිගේ නැතුව දෙවියෝ මුර කරනව ද?
මගේ ඇත් රජුනි අද ඔබ කොතැනක ද?

(c) Sumitha Publishers